# ඔබගේ පවුලේ අය හට ආරක්ෂාකාරීව සිටීම සඳහා උපකාර කිරීම

**ළමුන් හට මාර්ගස්ථව ඉගෙනීම, ගවේෂණය කිරීම, සහ මිතුරන් සොයා ගැනීම සිදු කල හැකිය. නමුත් අවධානම් තිබිය හැකිය.**

අහම්බෙන් ඔබේ දරුවාට අවුල් සහගත දේ දැකිය හැකි අතර, අමුත්තෙකු සම්බන්ධවීමට උත්සාහ ගැනීම හෝ හිරිහැරයට ලක්වීම අත්විඳිය හැකිය.
එළිමහනේ කාලය ගත කිරීමට ඇති අවස්ථා මඟහැරීම ආදියද සිදුවිය හැකිය.
ළමුන්ව මාර්ගස්ථව ආරක්ෂාකාරීව තබා ගැනීම සඳහා ඔබ විසින් පහසුවෙන් කල හැකි දේවල් කිහිපයක් මෙහි ඇත.

## මාර්ගස්ථ ආරක්ෂාව සම්බන්ධයෙන් පවුලක් වශයෙන් කථා කරන්න.

දරුවන් අපහසුතාවයට පත්වන හෝ බිය ගැනිවෙන යමක් මාර්ගස්ථව සිදුවුවහොත් ඔබට ඔවුන් වෙත සැම විටම පැමිණිය හැකි බවට ඔබගේ දරුවාට දන්වන්න.

ඔබගේ දරුවා භාවිතා කරන ක්‍රීඩා සහ ඇප් ඔබට පෙන්වන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිය හැකිය. ආරම්භ කිරීමට උපකාර වශයෙන් ඊසේෆ්ටි **කථාබහ භාවිතා කරන්න**.

## එකතුවී පවුලේ රීතීන් සම්පාදනය කර ගන්න

පවුලේ සැමදෙනා මාර්ගස්ථව ආරක්ෂාකාරීව සිටීමට උපකාර කිරීම සඳහා ඔබ විසින් සරල රීතීන් තෝරා ගත හැක. උපාංග භාවිතා කල හැක්කේ කොහිදීද, ළමුන් විසින් කුමන ක්‍රීඩා සහ ඇප් භාවිතා කල යුතුද, සහ මාර්ගස්ථව කොතරම් කාලයක් සිටිය යුතුද ආදී රීතීන් ඇතුලත් කල හැකිය. බොහෝ උපාංග භාවිතා කල හැකි ආකාරය සම්බන්ධ සීමා පැනවීම සඳහා සෙටිංග් ඇත. දෙමාපියන් විසින් කල හැකි පාලන සහ සෙටිංග් සඳහා **මෙම වීඩියෝව නරඹන්න**.

## උපකාර ලබා ගත හැක්කේ කොහින්ද යන්න දැන ගන්න

මාර්ගස්ථ ගැටළුවක් සම්බන්ධයෙන් උපකාර අවශ්‍ය වුවද කුමක් කල යුතුද සම්බන්ධයෙන් නොදන්නා අවස්ථාවල ඔබ විශ්වාස කරන මිතුරෙකු හෝ ඔබගේ දරුවාගේ පාසැලේ ගුරුවරයෙකු සමඟ කථා කරන්න. දෙමාපියන් හට ඇති අභියෝගයන් සම්බන්ධ උපදෙස් සඳහා **පේරන්ට්ලයින්** හි යම් අයෙකු සමඟ කථා කල හැක.
ඊසේෆ්ටි (ඊසේෆ්ටි) කොමසාරිස් විසින් සියළුම ඕස්ට්‍රේලියානු පවුම් මාර්ගස්ථව ආරක්ෂාකාරීව තබා ගැනීමට උපකාර කරයි. **මාර්ගස්ථ අපවාදය වාර්තා කිරීමට** සහ මාර්ගස්ථව ආරක්ෂාකාරීව සිටීම සම්බන්ධයෙන් **ඊසේෆ්ටි වෙබ් අඩවියෙහි** වැඩිදුර තොරතුරු ඇත.



**ඔබගේ පවුලේ අයව මාර්ගගතව ආරක්ෂාකාරීව තබා ගැනීම සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා අපගේ වෙබ් අඩවියේ ඊසේෆ්ටි පේරන්ට්ස් සොයන්න.**



Australian Government
eSafetyCommissioner
esafety.gov.au